# ගිණුම්කරණය

## 12 ශ්‍රේණිය

## 3.0 ද්විත්ව සටහන් ක්‍රමයට අනුව ගණුදෙනු හා සිද්ධීන් ගිණුම්ගත කරයි.



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

# ලූකා ෆැසියෝලි

## ගිණුම්කරණයේ පියා



ක්‍රි. ව. 1 445 දී ඉතාලියේ දී උපත ලද ලූකා පැසියෝලි තම උපන් ගමේ පැවති පුස්තකාලයක් වන කොන්තේපෙදෝරිකෝ හිදී මූලික අධ්‍යාපනය ලැබීය. අවුරුදු 20 දී පමණ ඔහු ගුරුවරයෙකු ලෙස ප්‍රචලිත විය. පසුව ධනවත් වෙළෙන්දෙකු වූ ඇන්තෝනියා රොන්පියෙන්සි යන අයගේ පුතුන් දෙදෙනාට ගණිත විෂය උගන්වා තිබේ. ලූකා පැසියෝලි ගණිත විෂයට අමතරව ගෘහ නිර්මාණ ශිල්පය, චිත්‍ර කලාව, ශුද්ධ විද්‍යාව යන විෂයයන් ගැන හසල කුසලතා තිබූ අයෙකි.

ක්‍රි. ව. 1 475 දී පූජකවරයෙකු වූ ඔහු විෂයානුබද්ධ ක්‍රියාකාරකම් වෙනුවෙන් රාජ්‍ය සම්මානය ලබා ගෙන ඇත. ලෝකයේ වෙළඳ කටයුතු වල දියුණුවත් සමග ගිණුම්කරණය විධිමත් විෂයක් බවට පත් කරමින් ද්විත්ව සටහන් න්‍යාය හඳුන්වා දීමට උත්සාහ කළහ. ඔහු විසින් ප්‍රථම වරට හේතුව = ඵලය යන මූලික ගිණුම්කරණ සමීකරණය හඳුන්වාදෙන අතර ඒ මත පදනම් ව දිවිත්ව දටහන් න්‍යාය ගොඩනැගීමට සමත් විය. 1 494 වර්ෂයේ දී ඔහු විසින් රචනා කරන ලද ජ්‍යාමිතික හා අංක ගණිතය නැමැති ග්‍රන්ථය (summa de arithmetica , Geometria , Propotioni , et , Propotionelite) මගින් ගිණුම්කරණය විධිමත් විෂයක් බවට පත් කිරීමට සමත් වූ ලූකා පැසියෝලි ගිණුම්කරණයේ පියා ලෙස හඳුන්වයි.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# ද්විත්ව සටහන් ක්‍රමය

## හැඳින්වීම

- සෑම ව්‍යාපාරික ගනුදෙනුවකම හා සිදුවීමක ද්විත්ව ස්වරූපයක් ඇති බව ගිණුම්කරණ සමීකරණය පාඩමේදී අප හඳුනා ගත්තෙමු.

- ගණුදෙනු වල ද්විත්ව මූල්‍ය ප්‍රතිඵලය ව්‍යාපාරය කෙරෙහි දෙයාකාරයකට බලපාන අතර, එකී බලපෑම එකවර සටහන් කරන ක්‍රමය "ද්විත්ව සටහන් ක්‍රමය" නම් වේ.

- ගණුදෙණුවක ද්විත්ව මූල්‍ය ප්‍රතිඵලය ද්විත්ව සටහන් මූලධර්මය මත පදනම් වන අතර, මෙය ක්‍රි. ව. 1 494 දී ඉතාලි ජාතික ලූකා පැසියෝලි (Luca Pacioli) පියතුමා විසින් මුල් වරට ඉදිරිපත් කරනු ලැබීය.

## ගිණුම

- ගිණුම්කරණ ඒකකයක ඇති වන මූල්‍යමය ගනුදෙනු ද්විත්ව සටහන් ක්‍රමය අනුව වාර්තා කරන සම්මත ආකෘතිය **"ගිණුම"** වේ.

- ව්‍යාපාරික ගනුදෙනු හා සිදුවීම් වල ද්විත්ව ස්වරූපය නිශ්චිත දිනක සිට තවත් නිශ්චිත දිනයක් දක්වා අනුපිළිවෙලින් ගිණුම් තුළ වාර්තා කරයි.

## ද්විත්ව සටහන් මූලධර්මය

- සෑම ගණුදෙණුවක ම ද්විත්ව ස්වරූපය ගිණුම් වලට පිටපත් කළ යුතු ආකාරය ද්විත්ව සටහන් මූලධර්මයෙන් කියවේ.

- එම ද්විත්ව ප්‍රතිඵලය හර හා බැර වශයෙන් එකවර සටහන් කිරීමට අනුගමනය කරන රීතීන් සමූහය ද්විත්ව සටහන් මූලධර්මය වේ.

- සෑම ගණුදෙණුවක් නිසාම වත්කම්, වගකීම් හා හිමිකම වැඩිවීම හෝ අඩුවීම ගිණුම්කරණයේදී හර හා බැර වශයෙන් සටහන් තබයි. හර යන්න භාවිත කළ යුත්තේ වැඩි වීමට ද අඩු වීමට ද යන්න හඳුනා ගැනීම සඳහා ද්විත්ව සටහන් රීතීන් වලින් මග පෙන්වයි.

**ව්‍යාපාරික ගනුදෙනු තුළින් බිහි වන ගිණුම් වර්ග 5 ට අනුව ද්විත්ව සටහන් මූලධර්මය**

| ගිණුම් වර්ගය | වැඩිවීම | අඩුවීම |
|---|---|---|
| වත්කම් | හර | බැර |
| වියදම් | හර | බැර |
| වගකීම් | බැර | හර |
| ආදායම් | බැර | හර |
| හිමිකම් | බැර | හර |



Copyright © www.e-thaksalawa.moe.gov.lk

# ලෙජරය සහ ලෙජර ගිණුම

- ගිණුම් සියල්ල එකතුවන/ ඒකරාශීවන ස්ථානය ලෙජරය නම් වේ. එම නිසා ගිණුම යන්නට **ලෙජර ගිණුම** යන නම භාවිතා කෙරේ.

- ලෙජරය පොතක්, ලිපි ගෙනුවක් හෝ කාඩ්පත් සමූහයක් ලෙස පවත්වාගෙන යා හැක. ගිණුම්කරණය සඳහා පරිගණක යන්ත්‍ර භාවිතා කරන ආයතනයක ගිණුමක ස්වරූපය බෙහෙවින් වෙනස් විය හැකිය. එවිට ගණුදෙනු වාර්තා චුම්භක පටියක (Magnetic Tape) හෝ චුම්භක තැටියක (Magnetic Disk) ආධාරයෙන් සටහන් කෙරේ.

# ගිණුමක ආකෘතිය

- සාම්ප්‍රදායික ලෙජර් ගිණුමක ආකෘතිය ඉංග්‍රීසි **T** අකුරක හැඩය ගනී.
- විවිධ ව්‍යාපාර වලදී ගිණුමක් පහත ස්වරූපයන්ගෙන් පවතිනු දැකිය හැක.

(1) හර .................................... ගිණුම බැර

(ii) හර .................................... ගිණුම බැර

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

(ii) .................................... ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|---|
| | | | | | |

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## අභ්‍යාස අංක (01)

පහත දැක්වෙන්නේ ව්‍යාපාර ආයතනයක සිදු වූ ගණුදෙණුවල ද්විත්ව සටහන් කිහිපයකි. ඊට සම්බන්ධ ගණුදෙණුව ලියන්න.

| ද්විත්ව සටහන | හර (රු.) | බැර (රු.) | ගණුදෙණුව |
|---|---|---|---|
| 1. මුදල් ගිණුම | 300 000 | | |
| ප්‍රාග්ධන ගිණුම | | 300 000 | |
| 2. මෝටර් රථ ගිණුම | 150 000 | | |
| ප්‍රාග්ධන ගිණුම | | 150 000 | |
| 3. බැංකු ණය ගිණුම | 20 000 | | |
| මුදල් ගිණුම | | 20 000 | |
| 4. ගැනුම් ගිණුම | 50 000 | | |
| මුදල් ගිණුම | | 30 000 | |
| වෙළඳ ගෙවිය යුතු දෑ පාලන ගිණුම | | 20 000 | |
| 5. විදුලි වියදම් | 8 000 | | |
| මුදල් ගිණුම | | 8 000 | |
| 6. වෙළඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම | 20 000 | | |
| විකුණුම් ගිණුම | | 20 000 | |
| 7. වෙළඳ ගෙවිය යුතු දෑ පාලන ගිණුම | 25 000 | | |
| මුදල් ගිණුම | | 20 000 | |
| ලද වට්ටම් ගිණුම | | 5 000 | |
| 8. මුදල් ගිණුම | 8 000 | | |
| දුන් වට්ටම් ගිණුම | 2 000 | | |
| වෙළඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම | | 10 000 | |
| 9. ගැනිලි ගිණුම | 6 000 | | |
| ගැනුම් ගිණුම | | 6 000 | |
| 10. විදුලි වියදම් ගිණුම | 2 000 | | |
| උපචිත විදුලි වියදම් ගිණුම | | 2 000 | |
| 11. මෝටර් රථ ක්ෂය ගිණුම | 5 000 | | |
| මෝ/රථ සමුච්චිත ක්ෂය ගිණුම | | 5 000 | |
| 12. හානි කරන අලාභ ගිණුම | 5 000 | | |
| වෙළඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම | | 5 000 | |
| 13. පරිත්‍යාග ගිණුම | 2 000 | | |
| ගැනුම් ගිණුම | | 2 000 | |
| 14. ගැනිලි ගිණුම | 5 000 | | |
| මුදල් ගිණුම | | 5 000 | |



Copyright © www.e-thaksalawa.moe.gov.lk

**අභ්‍යාස අංක (02)**

ලෙජරයක පවතින පහත සඳහන් ගිණුම් කවර වර්ගයක ද යන්න ඉදිරියෙන් ලියන්න.

| ගිණුමේ නම | ගිණුම් වර්ගය |
|---|---|
| 01. මෝටර් රථ ගිණුම | ................................................ |
| 02. මෝටර් රථ සමුච්චිත ක්ෂය ගිණුම | ................................................ |
| 03. ප්‍රාග්ධන ගිණුම | ................................................ |
| 04. වෙළඳ ලැබිය යුතු දෑ ගිණුම | ................................................ |
| 05. වෙළඳ ගෙවිය යුතු දෑ ගිණුම | ................................................ |
| 06. ලැබූ පොලී ගිණුම | ................................................ |
| 07. ලැබිය යුතු පොලී ගිණුම | ................................................ |
| 08. විදුලි වියදම් ගිණුම | ................................................ |
| 09. උපචිත විදුලි වියදම් ගිණුම | ................................................ |
| 10. රක්ෂණ ගාස්තු ගිණුම | ................................................ |
| 11. කලින් ගෙවූ රක්ෂණ ගිණුම | ................................................ |
| 12. කලින් ලැබූ කොමිස් ගිණුම | ................................................ |
| 13. ගැනිලි ගිණුම | ................................................ |
| 14. තොග ගිණුම | ................................................ |
| 15. ගැණුම් ගිණුම | ................................................ |
| 16. විකුණුම් ගිණුම | ................................................ |
| 17. මුදල් ගිණුම | ................................................ |
| 18. ආපසු යැවුම් ගිණුම | ................................................ |
| 19. ආපසු එවුම් ගිණුම | ................................................ |
| 20. ලද වට්ටම් ගිණුම | ................................................ |
| 21. දුන් වට්ටම් ගිණුම | ................................................ |
| 22. ආයෝජන ගිණුම | ................................................ |
| 23. හානි කරන අලාභ ගිණුම | ................................................ |
| 24. අපේක්ෂිත හානි කරන අලාභ ගිණුම | ................................................ |
| 25. අපේක්ෂිත හානි කරන අලාභ ඉඩ හැරීමේ ගිණුම | ................................................ |
| 26. ප්‍රත්‍යාගණන සංචිත ගිණුම | ................................................ |
| 27. රඳවා ගත් ඉපැයීම් ගිණුම | ................................................ |

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## අභ්‍යාස අංක (03)

අදාළ හිස්තැන් සහිත තීරු සම්පූර්ණ කරන්න.

| ගණුදෙණුව | ද්විත්ව සටහන් රීතිය | ද්විත්ව සටහන (රු.) |
|---|---|---|
| 1. ව්‍යාපාරය ආරම්භ කිරීමට අයිතිකරු රු. 200 000 ක් යෙදවීම. | වත්කම් වැඩිවීම - හර<br>හිමිකම් වැඩිවීම - බැර | මුදල් ගිණුම -හර 200 000<br>ප්‍රාග්ධන ගිණුම -බැර 200 000 |
| 2. රු. 25 000 ක ලී බඩු මිලට ගැනීම. | | |
| 3. රු. 60 000 ක භාණ්ඩ අත්පිට මුදලට ගැනීම. | | |
| 4. අත්පිට විකුණුම් රු. 100 000. | | |
| 5. දුරකථන බිල් ගෙව්වා රු. 6 000. | | |
| 6. රු. 30 000 ක භාණ්ඩ ණයට ගැනීම. | | |
| 7. රු. 40 000 ක භාණ්ඩ ණයට විකිණීම. | . | |
| 8. වෙළඳ ගෙවිය යුතු දෑ සඳහා මුදල් ගෙව්වා රු. 20 000. | | |
| 9. වෙළඳ ලැබිය යුතු දෑ වලින් මුදල් ලැබුණා රු. 35 000. | . | |
| 10.ගෙවල් කුලී ආදායම් ලැබුණා රු. 72 000 | | |
| 11.බැංකු ණයක් ගත්තා රු. 100 000. | | |
| 12.අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට රු. 5 000 ක් ව්‍යාපාරයෙන් ගත්තා. | | |



Copyright © www.e-thaksalawa.moe.gov.lk

**අභ්‍යාස අංක (04)**

**ද්විත්ව සටහන් නීතිය නිවැරදිව දක්වා නැති වගන්තිය වන්නේ,**

(1) වත්කම් හා වියදම් වැඩිවීම හර
(2) වගකීම්, හිමිකම් හා ආදායම් වැඩිවීම බැර
(3) වත්කම් හා වියදම් අඩුවීම හර
(4) වගකීම්, හිමිකම් හා ආදායම් අඩුවීම හර
(5) වත්කම් හා වියදම් අඩුවීම බැර (......)

**අභ්‍යාස අංක (05)**

**ගණුදෙණුවට අදාළ ද්විත්ව සටහන නිවැරදිව දක්වා ඇති වගන්තිය වන්නේ,**

(1) මුදලට භාණ්ඩ ගත්තා රු. 20 000 යි. -ගැනුම් ගිණුම හර , මුදල් ගිණුම බැර
(2) ණයට භාණ්ඩ ගත්තා රු. 30 000 යි. -තොග ගිණුම හර , වෙළඳ ලැබිය යුතු දෑ පාලන ගිණුම බැර
(3) මුදලට භාණ්ඩ විකුණුවා රු. 50 000 යි. -විකුණුම් ගිණුම හර , තොග ගිණුම බැර
(4) ණයට භාණ්ඩ විකුණුවා රු. 40 000 යි. -විකුණුම් ගිණුම හර , වෙළඳ ලැබිය යුතු දෑ ගිණුම බැර
(5) දුරකථන බිල ලැබුණා රු. 2 000 යි. - දුරකථන වියදම් ගිණුම හර , මුදල් ගිණුම බැර (......)

**අභ්‍යාස අංක (06)**

**පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද / අසත්‍ය ද යන්න දක්වන්න.**

(1) ගිණුම්කරණයේ පියා ලූකා පැසියෝලි සාමිවරයා ය. (..........................)
(2) ගණුදෙණු හා සිද්ධි වල ද්විත්ව බලපෑම ගිණුම්වල වාර්තා කරන්නේ ද්විත්ව සටහන් රීතිය පදනම් කර ගෙනය. (..........................)
(3) හිමිකම් පිළිබඳ ද්විත්ව සටහන් රීතිය හා වගකීම් පිළිබඳ ද්විත්ව සටහන් රීතිය එකිනෙකට වෙනස් වේ. (..........................)
(4) භාණ්ඩ ගැනිලි හිමිකම අඩු කරයි. (..........................)
(5) ගිණුම් කාලච්ඡේදයක් තුළ දී උපයන ශුද්ධ ලාභය අයිතිකරුගේ හිමිකම වෙනස්වීමට බලනොපායි (..........................)

**අභ්‍යාස අංක (07)**

අමන්තගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසය තුල සිදු වූ ගණුදෙණු පහත දැක්වේ.

(01) 01/01 අමන්ත විසින් රු. 500 000 ක මුදලක් යොදවා නව ව්‍යාපාරයක් ඇරඹීය.
(02) 01/03 රු. 200 000 ක බැංකු ණයක් ලබා ගැනීම.
(03) 01/08 රු. 80 000 ක ලී බඩු මිල දී ගැනීම.
(04) 01/16 රු. 50 000 ක භාණ්ඩ තොග මිල දී ගැනීම.
(05) 01/18 රු. 12 000 ක කොමිස් ආදායමක් ලැබීම.
(06) 01/22 රු. 5 000 ක විදුලි වියදමක් ගෙවීම.
(07) 01/23 රු. 12 000 ක ප්‍රචාරණ වියදමක් ගෙවීම.
(08) 01/25 බැංකු ණය රු. 10 000 ක් ගෙවීම.
(09) 01/29 අමන්ත සිය පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 5 000 ක මුදලක් ආපසු ලබා ගැනීම.
(10) 01/30 අත්පිට විකුණුම් රු. 70 000 යි.

**අවශ්‍ය වන්නේ,**

**ඉහත ගණුදෙණු සඳහා ලෙජර් ගිණුම් පිළියෙල කරන්න.**



Copyright © www.e-thaksalawa.moe.gov.lk

**අභ්‍යාස අංක (08)**

කමන්තගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසය තුල සිදු වූ ගණුදෙණු පහත දැක්වේ.

(01) 01/01 මධුර විසින් රු. 400 000 ක මුදලක් යොදවා නව ව්‍යාපාරයක් ඇරඹීය.

(02) 01/03 රු. 200 000 ක බැංකු ණයක් ලබා ගැනීම.

(03) 01/08 රු. 100 000 ක ලී බඩු මිල දී ගැනීම.

(04) 01/15 රු. 60 000 ක භාණ්ඩ තොග මිල දී ගැනීම.

(05) 01/18 රු. 25 000 ක කොමිස් ආදායමක් ලැබීම.

(06) 01/21 රු. 6 000 ක විදුලි වියදමක් ගෙවීම.

(07) 01/23 රු. 10 000 ක ප්‍රචාරණ වියදමක් ගෙවීම.

(08) 01/25 බැංකු ණය රු. 20 000 ක් ගෙවීම.

(09) 01/28 කමන්ත සිය පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 10 000 ක මුදලක් ආපසු ලබා ගැනීම.

(10) 01/30 අත්පිට විකුණුම් රු. 75 000 යි.

**අවශ්‍ය වන්නේ,**

**ඉහත ගණුදෙණු සඳහා ලෙජර් ගිණුම් පිළියෙල කරන්න.**

**අභ්‍යාස අංක (09)**

සමන්තගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසය තුල සිදු වූ ගණුදෙණු පහත දැක්වේ.

(01) 01/01 සමන්ත විසින් රු. 750 000 ක මුදලක් යොදවා නව ව්‍යාපාරයක් ඇරඹීය.

(02) 01/02 රු. 150 000 ක බැංකු ණයක් ලබා ගැනීම.

(03) 01/04 රු. 60 000 ක ලී බඩු මිල දී ගැනීම.

(04) 01/05 රු. 45 000 ක භාණ්ඩ තොග මිල දී ගැනීම.

(05) 01/06 රු. 6 000 කොමිස් ආදායමක් ලැබීම.

(06) 01/08 රු. 5 000 ක විදුලි වියදමක් ගෙවීම.

(07) 01/09 රු. 4 000 ක දුරකථන වියදමක් ගෙවීම.

(08) 01/10 බැංකු ණය රු. 15 000 ක් ගෙවීම.

(09) 01/11 අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 5 000 ක මුදලක් ආපසු ලබා ගැනීම.

(10) 01/13 අත්පිට විකුණුම් රු. 40 000 යි.

(11) 01/14 රු. 40 000 ක භාණ්ඩ තොග ණයට ගැනීම.

(12) 01/16 රු. 6 000 ක ප්‍රචාරන වියදමක් ගෙවීම.

(13) 01/17 රු. 20 000 ක සේවක වැටුප් ගෙවීම.

(14) 01/19 රු. 15 000 ක ගෙවල් කුලී ආදායමක් ලැබීම.

(15) 01/20 ණයට විකුණුම් රු. 40 000 යි.

(16) 01/21 රු. 15 000 ක මුදලක් වෙළඳ ගෙවිය යුතු දෑ සඳහා ගෙවීම.

(17) 01/24 රු. 5 000 ක රක්ෂණ වියදමක් ගෙවීම.

(18) 01/26 රු. 25 000 ක මුදලක් වෙළඳ ලැබිය යුතු දෑ වලින් ලැබීම.

(19) 01/27 රු. 50 000 ක ලී බඩු අයිතිකරු ව්‍යාපාරයට යෙදවීම.

(20) 01/30 රු. 5 000 ක භාණ්ඩ තොග හානි වීම

**අවශ්‍ය වන්නේ,**

**ඉහත ගණුදෙණු සඳහා ලෙජර් ගිණුම් පිළියෙල කරන්න.**

Copyright © www.e-thaksalawa.moe.gov.lk

**අභ්‍යාස අංක (10)**

නිශාන්ත ගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසය තුළ සිදු වූ ගණුදෙණු පහත දැක්වේ.

(01) 01/01 නිශාන්ත විසින් රු. 750 000 ක මුදලක් යොදවා නව ව්‍යාපාරයක් ඇරඹීය.
(02) 01/03 රු. 250 000 ක බැංකු ණයක් ලබා ගැනීම.
(03) 01/04 රු. 150 000 ක ලී බඩු මිල දී ගැනීම.
(04) 01/05 රු. 45 000 ක භාණ්ඩ තොග මිල දී ගැනීම.
(05) 01/07 රු. 20 000 කොමිස් ආදායමක් ලැබීම.
(06) 01/08 රු. 6 000 ක විදුලි වියදමක් ගෙවීම.
(07) 01/09 රු. 5 000 ක දුරකථන වියදමක් ගෙවීම.
(08) 01/10 බැංකු ණය රු. 25 000 ක් ගෙවීම.
(09) 01/11 නිශාන්ත සිය පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 10 000 ක මුදලක් ලබා ගැනීම.
(10) 01/12 අත්පිට විකුණුම් රු. 50 000 යි.
(11) 01/13 රු. 65 000 ක භාණ්ඩ තොග ණයට ගැනීම.
(12) 01/15 රු. 12 000 ක ප්‍රචාරන වියදමක් ගෙවීම.
(13) 01/17 රු. 32 000 ක සේවක වැටුප් ගෙවීම.
(14) 01/19 රු. 15 000 ක ගෙවල් කුලී ආදායමක් ලැබීම.
(15) 01/20 ණයට විකුණුම් රු. 38 000 යි.
(16) 01/21 රු. 35 000 ක මුදලක් වෙළඳ ගෙවිය යුතු දෑ සඳහා ගෙවීම.
(17) 01/23 රු. 8 000 ක රක්ෂණ වියදමක් ගෙවීම.
(18) 01/25 රු. 20 000 ක මුදලක් වෙළඳ ලැබිය යුතු දෑ වලින් ලැබීම.
(19) 01/27 රු. 50 000 ක ලී බඩු අයිතිකරු ව්‍යාපාරයට යෙදවීම.
(20) 01/30 රු. 4 000 ක භාණ්ඩ තොග හානි වීම

**අවශ්‍ය වන්නේ,**

**ඉහත ගණුදෙණු සඳහා ලෙජර් ගිණුම් පිළියෙල කරන්න.**

**අභ්‍යාස අංක (11)**

ඉන්දික ගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසය තුළ සිදු වූ ගණුදෙණු පහත දැක්වේ.

(01) 01/01 ඉන්දික විසින් රු. 300 000 ක මුදලක් යොදවා නව ව්‍යාපාරයක් ඇරඹීය.
(02) 01/02 රු. 100 000 ක බැංකු ණයක් ලබා ගැනීම.
(03) 01/04 රු. 60 000 ක ලී බඩු මිල දී ගැනීම.
(04) 01/05 රු. 50 000 ක භාණ්ඩ තොග මිල දී ගැනීම.
(05) 01/06 රු. 10 000 කොමිස් ආදායමක් ලැබීම.
(06) 01/08 රු. 4 000 ක විදුලි වියදමක් ගෙවීම.
(07) 01/09 රු. 2 000 ක දුරකථන වියදමක් ගෙවීම.
(08) 01/10 බැංකු ණය රු. 10 000 ක් ගෙවීම.
(09) 01/11 ඉන්දික විසින් සිය පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 5 000 ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් ආපසු ලබා ගැනීම.
(10) 01/13 අත්පිට විකුණුම් රු. 80 000 යි.
(11) 01/14 රු. 60 000 ක භාණ්ඩ තොග ණයට ගැනීම.
(12) 01/16 රු. 6 000 ක ප්‍රචාරන වියදමක් ගෙවීම.
(13) 01/17 රු. 15 000 ක සේවක වැටුප් ගෙවීම.
(14) 01/19 රු. 18 000 ක කඩ කුලී ආදායමක් ලැබීම.
(15) 01/20 ණයට විකුණුම් රු. 60 000 යි.



Copyright © www.e-thaksalawa.moe.gov.lk

(16) 01/21 රු. 28 000 ක මුදලක් වෙළඳ ගෙවිය යුතු දෑ සඳහා ගෙවීම, ලද වට්ටම් රු. 2 000 යි.
(17) 01/24 රු. 8 000 ක රක්ෂණ වියදමක් ගෙවීම.
(18) 01/26 රු. 370 000 ක මුදලක් වෙළඳ ලැබිය යුතු දෑ වලින් ලැබීම, දුන් වට්ටම රු. 3 000 යි.
(19) 01/27 රු. 70 000 ක ලී බඩු අයිතිකරු ව්‍යාපාරයට යෙදවීම.
(20) 01/30 රු. 6 000 ක භාණ්ඩ තොග හානි වීම

**අවශ්‍ය වන්නේ,**

**ඉහත ගණුදෙණු සඳහා ලෙජර් ගිණුම් පිළියෙල කරන්න.**

**අභ්‍යාස අංක (12)**

දිනුක ගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසය තුල සිදු වූ ගණුදෙණු පහත දැක්වේ.

(01) 01/01 දිනුක විසින් රු. 820 000 ක මුදලක් යොදවා නව ව්‍යාපාරයක් ඇරඹීය.
(02) 01/02 රු. 500 000 ක බැංකු ණයක් ලබා ගැනීම.
(03) 01/03 රු. 120 000 ක ලී බඩු මිල දී ගැනීම.
(04) 01/04 රු. 70 000 ක භාණ්ඩ තොග මිල දී ගැනීම.
(05) 01/05 රු. 20 000 කොමිස් ආදායමක් ලැබීම.
(06) 01/06 රු. 8 000 ක විදුලි වියදමක් ගෙවීම.
(07) 01/07 රු. 5 000 ක දුරකථන වියදමක් ගෙවීම.
(08) 01/08 බැංකු ණය රු. 50 000 ක් ගෙවීම.
(09) 01/09 බැංකු ණය පොළී රු. 10 000 ක් ගෙවීම.
(10) 01/10 අත්පිට විකුණුම් රු. 110 000 යි.
(11) 01/11 රු. 90 000 ක භාණ්ඩ තොග ණයට ගැනීම.
(12) 01/12 රු. 5 000 ක භාණ්ඩ වෙළඳ ගෙවිය යුතු දෑ වෙත ආපසු යැවීම.
(13) 01/12 රු. 30 000 ක ප්‍රචාරන වියදමක් ගෙවීම.
(14) 01/13 රු. 25 000 ක සේවක වැටුප් ගෙවීම.
(15) 01/14 රු. 22 000 ක කඩ කුලී ආදායමක් ලැබීම.
(16) 01/15 ණයට විකුණුම් රු. 110 000 යි.
(17) 01/16 වෙළඳ ලැබිය යුතු දෑ විසින් ආපසු එවුම් රු. 10 000 යි.
(18) 01/17 ව්‍යාපාරය විසින් රු. 6 000 ක භාණ්ඩ වැඩිහිටි නිවාසයකට පරිත්‍යාග කිරීම.
(19) 01/18 අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 4 000 ක භාණ්ඩ ලබා ගැනීම.
(20) 01/19 රු. 48 000 ක මුදලක් වෙළඳ ගෙවිය යුතු දෑ සඳහා ගෙවීම, ලද වට්ටම් රු. 2 000 යි.
(21) 01/20 රු. 12 000 ක රක්ෂණ වියදමක් ගෙවීම.
(22) 01/21 රු. 6 000 ක වෙළඳ ලැබිය යුතු දෑ ශේෂයක් හානි කරන අලාභ ලෙස කපා හැරීම.
(23) 01/22 රු. 65 000 ක මුදලක් වෙළඳ ලැබිය යුතු දෑ වලින් ලැබීම, දුන් වට්ටම රු. 5 000 යි.
(24) 01/23 රු. 70 000 ක ලී බඩු අයිතිකරු ව්‍යාපාරයට යෙදවීම.
(25) 01/24 රු. 10 000 ක භාණ්ඩ තොග හානි වීම.
(26) 01/25 බැංකු ණය පොලී ගෙවීම රු. 5 000 යි.
(27) 01/26 ලී බඩු ක්ෂය වීම රු. 8 000 යි.
(28) 01/28 හානි වූ තොගය සඳහා රු. 6 000 ක රක්ෂණ වන්දියක් ලැබීම.
(29) 01/29 පාසලක ක්‍රීඩා උත්සවයක් සඳහා රු. 15 000 ක මුදලක් පරිත්‍යාග කිරීම.
(30) 01/30 රු. 20 000 ක පරිගණකයක් සිංගර් සමාගමෙන් ණයට ගැනීම.

**අවශ්‍ය වන්නේ,**

**ඉහත ගණුදෙණු සඳහා ලෙජර් ගිණුම් පිළියෙල කරන්න.**



Copyright © www.e-thaksalawa.moe.gov.lk